සමාජය තුළ දිවි තොර කර ගැනීම් පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීම වැදගත් වෙන අතර වගකීම් සහගතව සහ ආචාර ධමර්ානුකූලව දිවි තොර කර ගැනීම් වාතර්ා කිරීමද ඒ හා සමානවම වැදගත් වේ. දිවි තොරකර ගැනීම් වාතර්ා කිරීමේදී, ඒ සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාරිටන්ස් වැනි සංවිධාන සහ ලෝකයේ මාධ්‍ය ආචාර ධමර් පද්ධති මගින් හඳුන්වා දී ඇති මාගෙර්ාපදේශයන් පිළිපැදීම අත්‍යවශ්‍ය වන්නේ ඒ හෙයිනි.
එවැනි දිවි තොරකර ගැනීම් වාතර්ා කිරීම පිළිබඳ මාධ්‍ය මාගෙර්ාපදේශයන් පෙන්වා දෙන්නේ,
* දිවි තොර කර ගැනීම් පිළිබඳව වන පුවත් වාතර්ාවන් සමඟින්, හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇතිව සිටින අයෙකුට අවශ්‍ය උපදේශනය ලබා දීමටත්, ඒ ඔස්සේ එම තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීමටත් ඉඩක් ලැබිය හැකි බව.
* එසේම දිවි තොර කර ගත් ආකාරය සඳහන් නොකිරීම ඔස්සේ, අනුකාරක දිවි තොරකර ගැනීම් ඇති විය හැකි ඉඩ අවම කරගත හැකි වන බව.
* දිවි තොරකර ගත් අයගේ අනන්‍යතාවයන් (මහජන බැඳියාවට අයත් නම් මිස) හෙළි නොකිරීම, මිය ගිය අයගේ පවුලේ අය සහ සමීපතමයන්ට මුහුණ දීමට සිදුවිය හැකි, වේදනාව සහ දිවි තොර කර ගැනීම් සම්බන්ධ සමාජ ගහර්ාව අවම කරනු ඇති බව.
මෙම පසුබිම තුල යාපනයේ තුම්පලායි වල එක් දරු පියෙක් දිවි තොර කරගැනීමෙන් මරණයට පත්වීමේ සිදුවීම, තමිල්න් පුවත්පත තුළ පළව තිබූ අයුරු මෙහිදී විමසා බැලීමට හැක.
මෙය කෙතරම් දුරට දිවි තොරකර ගැනීම් වාතර්ා කිරීම පිළිබඳ මාධ්‍ය මාගෙර්ාපදේශයන්ට අනුකූලව වාතර්ා වී ඇතැයි ඔබ සිතන්නේ ද?
උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාගර්යෙන් සම්බන්ධ කරගත හැක)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!